# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2078/51 - 2018 ජූලි මස 06 වැනි සිකුරාදා - 2018.07.06**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 9/2011

**1963 අංක 11 දරන මුදල් පනත**

72 වැනි වගන්තිය යටතේ වූ නියමය

1963 අංක 11 දරන මුදල් පනතේ 71 වන වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 72 වන වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මුදල් හා ජනමාධ්‍ය අමාත්‍ය මංගල සමරවීර වන මම, මෙහි උපලේඛනයෙහි විස්තර කර ඇති දේපළ වර්ෂ දෙදහස් දහඅටක් වූ ජූලි මස 06 වැනි දින සිට බලාත්මක වන පරිදි, 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ පිහිටුවන ලද මහජන බැංකුව වෙත මේ නියමය මගින් පවරා දෙමි.

මංගල සමරවීර,
මුදල් හා ජනමාධ්‍ය අමාත්‍ය.

2018 ජූලි මස 06 වැනි දින,
කොළඹ දී ය.

**උපලේඛනය**

දකුණු පළාතේ, ගාලු දිස්ත්‍රික්කයේ බෙන්තර වලල්ලාවිට කෝරළයේ, ඇල්පිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අම්බන අංක 94 දරන ග්‍රාම නිලධාරි වසමේ පිහිටි, අංක : 414393 දරන හිමිකම් පිඹුරේ සඳහන් ''පන්විලේ කුඹුර'' කියන උතුරට අඩිපාර ද, නැගෙනහිරට පාර ද, අංක : 331300, 327968 සහ 390496 දරන හිමිකම් පිඹුරුවල සඳහන් ඉඩම් සහ කැබැලි අංක 112 1/2 ට සඳහන් ඉඩම ද, දකුණට සහ බස්නාහිරට බෙලිගස්යායේ ඇල ද යන මායිම් තුළ පිහිටි අක්කර එකකුත් රූඩ් දෙකකුත් පර්චස් දහසය (අ:1 රූ:2 පෑ:16) ක් විශාල කුඹුරු බිමෙන් සහ ඊට අයිති සියලු දෙයිනුත් නොබෙදූ හයෙන් එක ද, දහසයෙන් එක සහ අටෙන් එක (1/6, 1/16, 1/8) පංගුව ද වේ.

ඉහත සඳහන් නෙබෙදූ ඉඩම් කොටස් සඳහා එම්. ආරියසේන බලයලත් මිනින්දෝරු තැන විසින් මැන සාදන ලද අංක : 2919$^{B}$ සහ 2007.08.27 දින දරන පිඹුර ප්‍රකාරව ලොට් අංක 121$^{D2}$ වශයෙන් ලකුණු කර ඇති අතර එහි ප්‍රමාණය පර්චස් 90.66 කි.

මෙම ඉඩම බලපිටිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ B 539/169 යටතේ ලියාපදිංචි වී ඇත.

07 - 650

1A - PG 4104 — 107 (2018/07) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*